එදිනෙද ජීවිතයට විද්‍යාව



# දේශීය ඖෂු

**ආචාර්ය උපාලි ඇම් සේනානායක**

**දේශීය ඖෂධ හෙවත් ශාක සාර පදනම් ආයුර්වේද, යුනානි ආදිය ඇතුළත් ඖෂධ ප්‍රදර්ශනයක් පසුගියදා කොළඹ දී පැවැත්විණි. දේශීය සහ විදේශීය සමාගම් සියයකට අධික සංඛ්‍යාවක් මෙහි භාණ්ඩ ප්‍රදර්ශනය කර තිබිණි. එහි වැදගත්ම ලක්ෂණය වූයේ වයස හෝ සමාජ තරාතිරම නොබලාම විශාල ජන සංඛ්‍යාවක් එම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණීමයි.**

ආයුර්වේද හෙවත් ආයුෂ දික්කර ගන්නා වේදය ඇරඹියේ මීට වසර 3000 කටත් පෙර ය. එදා මනස දියුණුකර ධනවන්තරී වැනි මුණිවරු ඒ ඒ රෝගය සුව කිරීමට සමත් ඖෂධ තනි තනිව හෝ වට්ටෝරු වශයෙන් ලේඛන ගත කර තිබුණි එකී වට්ටෝරුවල එකතුවක් ලෙස එය හඳුන්වා දිය හැකිය. එම ලේඛන වල සඳහන් අයුරින් ඖෂධ පිළියෙල කර යෙදීමෙන් රෝගය සුවකර ගැනීමට හැකි විය. එම චිකිත්සක ක්‍රම රෝගය පමණක් නොව රෝග නිධානය පවා සුව කිරීමට ඉලක්ක කොට තිබිණි.

දැනට ප්‍රචලිත ව ඇති බටහිර ඖෂධ ක්‍රමය හෙවත් ඇලෝපති වෛද්‍යකමෙහි මූලාරම්භය ශාක සාර ඖෂධ ය. එදා සෘෂි ඥානයෙන් දුටු රෝග නිවාරණ ක්‍රම,වාදයෙන් තොරව මහජනතාව පිළිගන්නා ලදී. බටහිර වෛද්‍යකමේ එක් ලක්ෂණයක් වන්නේ ඒ ඒ රෝගය සුව කිරීමට ගන්නා ඖෂධ සතු රසායන ද්‍රව්‍ය එකක් හෝ කීපයක් ගැන පරීක්ෂණ සහ විශ්ලේෂණ ක්‍රම යොදා සොයා ගැනීමයි. සරල උදාහරණයක් ගන්නේ නම් සෙම්ප්‍රතිශ්‍යාවට ගනු ලබන පස් පංගුව ගැන විස්තරයක් සෙවීමට උත්සාහ කරමු. මෙම වට්ටෝරුවේ ඇත්තේ ඉඟුරු, කොත්තමල්ලි, පත්පාඩගම්, තිප්පිලි සහ කටුවැල් බටු සමව ගෙන පතඅට පත එකට සිඳුවා පානයට ගැනීමයි. ඉන් සෙම්ප්‍රතිශ්‍යාවට විශාල සහනයක් ලැබෙන බව අත් දුටුවකි. පස් පංගුව ඖෂධවල රසායන ද්‍රව්‍ය ගණනාවක් ඇත. පාඨක දැන ගැනීම සඳහා කෙටියෙන් එය ඉදිරිපත් කරමි. ඉඟුරුවල ඇත්තේ "ජින්ජබරීන්" සහ ජින්ජරෝල් නම් ප්‍රධාන රසායන දෙකයි. එය කට දන බව අපි දන්නා කරුණකි. කට දැවීම නිසා මුඛයෙන් සහ ශ්වසන පද්ධතියෙන් සෙම විශාල ප්‍රමාණයක් පිටවෙයි. ශ්වසන මාර්ග අවහිරය මඟ හැර හුස්ම ගැනීම පහසු කරවයි. කොත්තමල්ලිවල ඇත්තේ "ලිනලෝල්" නම් රසායන ද්‍රව්‍යය යි. එය ප්‍රනීත සුවඳ කාරකයකි. එය සෙම පිට කිරීමට උදව්වන අතර ශ්වසන නාල විශාල වීමක් ඇති කෙරේ. හුස්ම ගැනීම පහසු කෙරේ. පත්පාඩගම්වල ඇති ටර්ජින් රසායනය වේදනාව ගෙන දෙන ශ්වසන නාල ඉදිමීමට සහනයක් ගෙන දෙයි. තිප්පිලිවල ඇත්තේ "පිපරීන්" නම් කට දන රසායන සංයෝගයකි. එය ද ශ්වසන නාල අහුරණ සෙම ඉවත් කිරීමට උදව් වෙයි. මෙම සෙම දියර සමඟ රෝග බීජ විශාල සංඛ්‍යාවක් නාසයෙන් පිටවීමක් ඇති කරයි. රෝග බීජ පිට වීම රෝගයේ ඉක්මන් සුවයට හේතු වෙයි.

කටුවැල් බටුවල ඇත්තේ සොලසොඩීන් නම් රසායන සංයෝගය යි. එය රසිනෝ වයිරසය විනාශ කර, ශ්වසන නාල අවහිර කරන සෙම බුරුල්කර ඉවතට යැවීමට සලස්වයි. මෙම පස් පංගුවේ පස් වැදෑරුම් ක්‍රියාව ඉක්මනින් සෙම්ප්‍රතිශ්‍යාව සුව කිරීමට හේතු වෙයි.

පස් පංගුව තම්බා බීමට වඩා ක්ෂණිකව දියවන ඖෂධ කුඩක් දැන් වෙළෙඳ පොළේ ඇත. ඇත්තෙන්ම මෙය විස්කම් නිපැයුමකි. පස් පංගුව නියම ඖෂධ වේලා කුඩු කර එය ඊතයිල් මද්‍යසාරය මඟින් නිස්සාරණය කරනු ලැබේ. මෙහි දී එම ශාක කොටස්වල අඩංගු ජල ද්‍රාව් සියලු රසායන එයට දිය වී එයි. ඉන්පසු අමතර මද්‍ය සාරය ඉවත් කළ විට ලැබෙන්නේ කුඩකි.

මෙම කුඩෙහි මූලික ශාක ඖෂධවල අඩංගු සියලු රසායන ඇතුළත්ව තිබේ. එම කුඩ සීනි මාධ්‍යයක විසුරුවා කෝප්පයකට අවශ්‍ය පමණට එක එක පැකැට්ටුවකට ඇතුළත් කර සීල් කර ඇත. මෙම සරල ඖෂධය ක්‍රමානුකූලව පානයට ගැනීමෙන් රෝගය ඉක්මනින් සුවවෙයි. මෙම පිළියෙළ කිරීම නිසා පාරිභෝගිකයාට ප්‍රධාන සහන කීපයක් ලැබේ. නිසි අමු ද්‍රව්‍ය සෙවීමක් අනවශ්‍ය ය. තැම්බීමට ගතවන කාලය සහ ඉන්ධන ඉතිරි වෙයි. ඇතැම් වට්ටෝරුවල පස් පංගුවට වෙනිවැල්ගැට ද එකතු කර ඇත. එය සතු බර්බේරීන් නම් රසායන සංයෝගය ප්‍රබල විෂබීජ නාශකයකි. සෙම්ප්‍රතිශ්‍යා රෝග බීජ නසයි.පිටගැස්ම වැළඳීම පාලනය කිරීමට ද වෙනිවැල්ගැට තම්බා පානයට දෙනු ලැබේ.

ආයුර්වේදයේ බොහෝ තම්බා පානය කරනු ලබන ඖෂධ වට්ටෝරු ඇත්තේ පතඅට එකට සිඳුවා පානය කිරීමටය. වතුර කෝප්ප අටක් එකතු කර එක කෝප්ප දක්වා ඝාන්ද්‍රනය කර නිපදවා ගැනීම මෙහි දී කරනු ලැබේ. බොහෝ රෝග නිවාරණ ඖෂධ අයත් වන්නේ ඇල්කලොයිඩ්(ALKALOID)නම් වර්ගයට යි. ඒවා ජලයේ දිය නොවේ. එහි ලවණ පමණක් ජලයේ දිය වෙයි. බොහෝ ඖෂධ වට්ටෝරුවල එම ඇල්කලොයිඩ් ලවණ බවට පෙරළන ද්‍රව්‍ය අඩංගු ය. පතඅට එකට සිඳින කාලය ගතවන්නේ ශාක සාරය ජලයේ දියවීම සඳහාය. ඕනෑම කසාය නිස්සාරණයක් ජලය සිඳවා ගත් විට ලැබෙන ඝන ද්‍රව්‍ය ප්‍රමාණය සියයට දෙකක් පමණ වෙයි. සියලු රෝග නිවාරණ රසායන එහි ඇතුළත් වේ.

ආයුර්වේදයේ ඖෂධ විවිධ ලෙස නිපැයුම් කර ඇත. විශාල වශයෙන් ඇත්තේ කසාය ලෙස ය. මේ එක වට්ටෝරුවක ඖෂධ වර්ග පහේ සිට පනහක් අතර ප්‍රමාණයක් වෙයි. මෙතරම් ඖෂධ ශාක ගණනාවක් වට්ටෝරුවට එකතු කර ඇත්තේ ඒවාගේ රෝග නිවාරණ විවිධ ඖෂධ අඩංගු හෙයිනි. මෙහි දී ඇතැම් ශාක මුළුමනින්ම යොදා ගන්නා අතර, ඇතැම් ශාක මුල් පොතු, අරටු හෝ ගෙඩි වශයෙන් ගැනේ. මෙම ඖෂධ එකතුව සාමූහිකව රෝගය නිවාරණයට කටයුතු කරයි. මෙහි දී නිවැරදි ශාක කොටස් ගැනීම අත්‍යවශ්‍ය වෙයි. උදාහරණයක් ලෙස තලන බටු මුල් වෙනුවට වම්බටු මුල් ගන්නේ නම් ඉන් යහපතක් සිදු නොවේ. මෙම ශාක කොටස් ඖෂධ හෙවත්, රසායන සංයෝග, රෝගය වේගයෙන් සුව කිරීමට උදව්වන බව විද්‍යාත්මක පර්යේෂණවලින් හෙළි වී ඇත. එය විද්‍යාවේ දී හැඳින්වන්නේ "SYNERGICයන නමිනි. ඇතැම් රසායන ඒවා වඩාත් දියවීමට උදව්වන අතර ඇතැම් රසායන ඒවා ඉක්මනින් ශරීරයට උරා ගැනීමට උදව් කරයි. මේ හේතුව නිසා ඕනෑම ඖෂධ ශාක වට්ටෝරුවක ඒ ඒ ශාක වර්ග සහ ශාක කොටස් නිවැරදිව තෝරා ගත යුතුය.

ඇතැම් නිෂ්පාදන චූර්ණ (කුඩක්) තලපයක් (කල්ක) සහ ගුලි ආදි වශයෙන් සකස්කර ඇත. මේ අතර "පත්තු" ලෙස හඳුන්වන ඖෂධ නිෂ්පාදන ද වෙයි. ගසක මල්, මුල්, ගෙඩි, පොතු හෝ කොළ එකට කොටා ඇතැම් විට වන්ඩුවෙන් තම්බා මෙම පත්තු නිෂ්පාදනය කර ඇත. පත්තුවක් නිතරම බඳින්නේ ශරීරයේ බාහිර කොටසකට ය. එම පත්තුවේ ඇති ශාක රසායන සම අතරින් ශරීරය තුළට ගමන් කර අවශ්‍ය රෝගී කොටස් සුව කරයි. බොහෝ විට ශරීරයේ කැඩුම් බිඳුම් ඇති තැනක පත්තුවක් බඳිනු ලැබේ. එහි ඇති රසායන බිඳී ගිය අස්ථි කොටස් වේගයෙන් සවි වීමට උදව් වන බව පෙන්වා දී ඇත. තෙල් බෙහෙත් ඇඟේ සම මත ආලේප කරන්නේද මෙම චිකිත්සක ගුණ ලබා ගැනීමට ය. අංශභාග රෝගීන්ට සම මත ආලේප කරන මහා නාරායන තෙල, වාත රෝග සඳහා ප්‍රත්‍යක්ෂ බෙහෙත් තෙලකි. මෙහි ඇති ඖෂධ රසායන හම මතින් ගමන් කර ඇතුළත ඇති රුධිර වාහිනී නාල සහ ස්නායු සංඥා ක්‍රියාකාරීත්වය උත්තේජනය කර, වාත රෝගවලට විශාල සහනයක් ලබා දෙයි. ඖෂධ ආලේප ද ක්‍රියා කරන්නේ මෙලෙසම ය. මේ හැම දෙයක් ම නිපදවා ඇත්තේ තෙලමය මාධ්‍යයක් වශයෙනි. එහි තෙලයේ දියවන රසායන තිබීම ඊට හේතුවයි. උදාහරණයක් ලෙස උණ වේදනාවට ගන්නා ඇස්ප්‍රීන් පෙත්තේ ඇත්තේ අස්ටයිල් සැලිසිලික් අම්ලය නම් රසායනය යි. එය ජලයේ දියවෙයි. එම රසායන සංයෝගය ම ව්‍යුහය වෙනස් කර මීතයිල් සැලිසිලේට් නම් සංයෝගය නිපැදවූ විට තෙලමය මාධ්‍යයක දියවෙයි. එය මැස්ලින් හෝ වෙනත් තෙලෝදයක්

පස් පංගුව තම්බා බීමකට වඩා ක්ෂණිකව දියවන ඖෂධ කුඩක් දැන් වෙළෙඳ පොළේ ඇත. පස් පංගුව නියම ඖෂධ වේලා කුඩු කර එය ඊතයිල් මද්‍යසාරය මඟින් නිස්සාරණය කරනු ලැබේ. මෙහි දී එම ශාක කොටස්වල අඩංගු ජල ද්‍රාව් සියලු රසායන එයට දිය වී එයි. ඉන්පසු අමතර මද්‍ය සාරය ඉවත් කළ විට ලැබෙන්නේ කුඩකි. මෙම කුඩෙහි මූලික ශාක ඖෂධවල අඩංගු සියලු රසායන ඇතුළත්ව තිබේ.

ලෙස සකස් කර සමමත ගැල්වීමෙන් අවශ්‍ය තැනට ඉක්මන් සහනය ලබාදෙයි. ඖෂධයේ ව්‍යුහය තරමක් වෙනස් කළ ද ලැබෙන්නේ එකම සහනයකි. එනම් වේදනා නාශකයකි. ඇස්ප්‍රීන් පෙත්තක් කුඩුකර සම මත ආලේප කළ නොහැකිය.

ආයුර්වේද ඖෂධ රෝගය සුව කිරීමට පමණක් නොවරෝග නිධානය ද සුව කරයි. එම ඖෂධ ක්‍රියා කරන්නේ සෙමිනි. එහෙයින් බටහිර ඖෂධයක් මෙන් ඉක්මන් සුවයක් අපේක්ෂා කළ නොහැකි ය. මෙම හේතුව නිසා ම ඉක්මන් රෝග සුවය සඳහා බොහෝ දෙනා බටහිර ඖෂධ ගැනීමට පුරුදු වී ඇත.

ආයුර්වේද ඖෂධ ගැන සඳහන් කරන විට අරිෂ්ට ගැන ද කරුණු සඳහන් කළ යුතුය. දසමූල, අශ්වගන්ධ , අශෝක, ද්‍රාක්ෂා ආදී අරිෂ්ට විශාල සංඛ්‍යාවක් ආයුර්වේදයේ සඳහන්ව ඇත. නියමිත වට්ටෝරුවට අමුද්‍රව්‍ය ගෙන කෂාය කර එය පෙරා වෙන් කර එයට මී පැණි, සීනි ආදිය දමා දින 50 ක් පමණ පැසවීමෙන් අරිෂ්ට ලැබේ. පැසවීමේ ක්‍රියාවලියේ දී යීස්ට් විසින් සීනි මී පැණි, ඊතයිල්, මද්‍යසාරය බවට පෙරළයි. අරිෂ්ටයක් නිසි ලෙස පැසවීමේ දී මද්‍යසාරය සියයට 9 + 10 අතර ප්‍රමාණයක් ඇත. නියම අරිෂ්ට ගුණදායක ය. එහෙත් මාත්‍රාව ඉක්මවා ගැනීමෙන් අක්මාව ගල් වීමට පවා පුළුවන.